
# සන්නිවේදන ආකෘති



කෞශල්‍යා ගම්ලත්

# සන්නිවේදන ආකෘතියක් යනු:




- විවිධ අංග ලක්ෂණ වලින් සමන්විත සංකීර්ණ ක්‍රියාවලියක් වූ සන්නිවේදන ක්‍රියාවලියේ ස්වභාවය පහසුවෙන් අවබෝධ කර ගැනීමට නිර්මාණය කරන ලද රූප සටහනකි.

# සන්නිවේදන ආකෘති මගින්

- සන්නිවේදන ක්‍රියාවලියේ විද්‍යමාන වනදේ සාරාංශ කර දක්වයි
- තොරතුරු ගලායාම පෙන්වයි
- සන්නිවේදකයා හා ග්‍රාහකයාගේ ස්වරූපය, දක්ෂතා, ප්‍රබලතා පෙන්වයි
- මාධ්‍ය ක්‍රියාවලිය සිදුවන ආකාරය පෙන්වයි


# සන්නිවේදන ආකෘති පිළිබඳ මහාචාර්ය විමල් දිසානායක මහතාගේ මතය

- “සන්නිවේදනය හා සම්බන්ධ මූලික අංග ලක්ෂණ කිහිපයක් සන්නිවේදන ආකෘති මගින් පෙන්නුම් කෙරේ. සන්නිවේදනයේ සැබෑ ස්වරූපය වටහා ගැනීමට උපකාරී වන මුඛ්‍ය ලක්ෂණ කිහිපයක් තෝරා ඒවා අතර පවතින සම්බන්ධතාව මතු කොට දැක්වීම සන්නිවේදන ආකෘතියක් මගින් ඉටුවන ප්‍රධාන කර්තව්‍යයකි“.
  - මානව සන්නිවේදනය  කෘතිය


# සන්නිවේදන ආකෘති ප්‍රධාන කොටස් 2 කි.


- රේඛීය ආකෘති
- රේඛීය නොවන ආකෘති

Linear




Interactive







# ප්‍රධාන සන්නිවේදන ආකෘති


- ඇරිස්ටෝටල් ආකෘතිය
- හැරල්ඩ් ඩී. ලැස්වෙල් ආකෘතිය
- ක්ලෝඩ් ශැනන්  හා වොරන් වීවර් ආකෘතිය
- ශ්‍රාම්-ඔස්ගුඩ් ආකෘතිය

# ඇරිස්ටෝටල් ආකෘතිය





# හැරල්ඩ් ලැස්වෙල් ආකෘතිය




## LASSWELL MODEL OF COMMUNICATION

| WHO | SAYS WHAT | IN WHICH CHANNEL | TO WHOM | WITH WHAT EFFECT |
|---|---|---|---|---|
| COMMUNICATOR | MESSAGE | MEDIUM | RECEIVER | EFFECT |
| කවරෙක්ද? | කුමක් කියයිද? | කුමන නාලිකාවකින්ද? | කා හටද? | කුමන බලපෑමක් සදහාද? |


©www.busknowledgechahiye.blogspot.com

# ශැනන් හා වීවර් ආකෘතිය





## SHANNON AND WEAVER MODEL OF COMMUNICATION



# ශ්‍රාම් ඔස්ගුඩ් ආකෘතිය- අදියර 4 කි

(I) A ⟶ M ⟶ B


සන්නිවේදකයා සන්දේශය ග්‍රාහකයා

සන්නිවේදන ක්‍රියාවලියේ මූලික අවස්ථා වන මෙහි තොරතුරු එක් දිශාවකට පමණක් ගමන් කරයි. එනම් ග්‍රාහකයාට (B) සන්නිවේදනය ක්‍රියාවලියට සම්බන්ධ වීමට මෙහි අවස්ථාවක් නැත.

(II) A ⇄ ⇄ B

දෙවන පියවර මඟින් ශ්‍රාම් විග්‍රහ කරනුයේ සන්නිවේදකයාට (A) මෙන් ම ග්‍රාහකයාට (B) ද සිය අදහස් සහ යෝජනා ආදිය ඉදිරිපත් කරමින් සන්නිවේදන ක්‍රියාවලියට සම්බන්ධ වීමට අවස්ථාව ඇති බවයි.

(III)




මෙම තෙවන අවස්ථාවේ දී ශ්‍රාම් පෙන්වා දෙනුයේ සන්නිවේදන ක්‍රියාවලිය එක් ස්ථානයකින් ආරම්භ වී තවත් ස්ථානයකින් අවසන් වන ක්‍රියාවලියක් නොවන බවයි. එය සන්නිවේදකයාගෙන් ග්‍රාහකයාටත් ග්‍රාහකයාගෙන් සන්නිවේදකයාටත් ආදී වශයෙන් භූමිකා හුවමාරු වෙමින් අඛණ්ඩ ව සිදු වන ක්‍රියාවලියකි.


මෙහිදි සන්දේශය යන්න වැදගත් වන බව දක්වන ශ්‍රාම් එමඟින් සන්නිවේදනයට සහභාගී වන පාර්ශව අතර සම්බන්ධතාව සමීප කළ හැකි බවත් එම හේතුවෙන් සන්දේශයෙහි අන්තර්ගතය සහ එය සම්පාදනය කරන ආකාරය පිළිබඳ අවධානයට ගත යුතු බවත් සඳහන් කරයි.

ශ්‍රාම් විසින් ඉහත අවස්ථාව තව දුරටත් පෝෂණය කිරීම සඳහා චාර්ල්ස් ඔස්ගුඩ් නම් සමාජ විද්‍යාඥයාගේ ද සහාය ඇති ව සිව්වන අවස්ථාවේ දී ‘ඔස්ගුඩ් ශ්‍රාම් ආකෘතිය’ ඉදිරිපත් කර ඇත.


# ශ්‍රාම් ඔස්ගුඩ් ආකෘතිය






# අත්දැකීම් පසුතලය




අත්දැකීම් ක්ෂේත්‍රය
අත්දැකීම් ක්ෂේත්‍රය
මූලාශ්‍රය
සංඥාව
අග්‍රස්ථානය
අකේතකරණය
විකේතකරණය